# ගණිත විෂයට අත්වැළක්

**Athil Goonesekera**
BSc (Sri J'Pura), MSc Elect.Eng. ( Latrobe),DipEd(Latrobe)

නවීන විද්‍යාව හා තාක්ෂණයට පිවිසීමට අත්වැලක් වන ගණිත විෂය ළමුන්ගේ විෂය මාලාවේ ඇති වැදගත්ම අංගයකි. ඒ සඳහා අත්වැලක් සැපයීමට සන්නස පුවත්පත තුළින් ලිපි පෙළක් පළකිරීමට තීරණය කර ඇත.

මෙම ගණිතය පිළිබඳ ලිපි පෙළ දෙයාකාරයකින් ඉදිරිපත් කිරීමට අදහස් කර ඇත. එහි පළමු කොටස දෙමව්පියන් දැනුවත් කිරීම අරමුණුකොට ඇති අතර අනෙක් කොටස විවිධ වයස් කාණ්ඩ වලට අයත් ළමුන්ගේ ගණිත දැණුම වැඩි දියුණු කිරීමට යොමු කරනු ඇත.

දෙමව්පියන් අරමුණුකොට ඇති කොටසේ පරමාර්ථය ඔවුන්ට ගණිතය ඉගැන්වීම නොවෙයි. අපගේ දෙමව්පියන්ගේ ගණිත දැණුම ඉතා ඉහළ මට්ටමක ඇති බව ලේඛකයා ඉතා හොඳින් දනී. ඔහුගේ ප්‍රයත්නය වන්නේ මෙම අගනා දායාදය ක්‍රමවත්ව හා ළමයාගේ අදාළ වයසට දරාගත හැකි ආකාරයට ආරෝ පනය කරවීමයි. ගෙදර නොමිලේ ඇති ගණිත දැණුම එහි සිටින උතුම් ගුරුවරුන් ලවා ළමයාට ඉගැන්වීමට දෙමව්පියන්ගේ සහයෝගය ලේඛකයා බලාපොරොත්තුවේ. තවද, කුඩා කාලයේ සිටම ළමයා ගණිතයට කැමැත්තක් හා ලැදිකමක් දක්වන ආකා රයේ පසුබිමක් ගෙදර පරිසරය තුළින් ජනනය කිරීම ද පරමාර්ථයකි.

සම්පූර්ණ පාඩම් මාලාව සිංහල භාෂාවෙන් පළකිරීම ප්‍රායෝගික නොවන බව සැමට තේරුම්ගත හැකි යැයි සිතමි. නමුත්, භාෂා උන්නතිය උදෙසා භාෂා මිශ්‍රණයකින් මෙම ලිපි පෙළ සැකසීමට බලාපොරොත්තුවෙමි.

Mathematics is one of very important subjects. This is the enabling discipline for all of Science and Technology that it is and to recognize its power in providing tools for analytical thought and for concepts and language for quantitative descriptions of the world (RAND Mathematics Study Panel, 2002).

Mathematics is not a very hard subject unless you make it hard by applying irrelevant tactics. As I believe by birth every human is a Mathematician. When grove up, humanus practice different approaches to improve their mathematical abilities. As Sri Lankans we should be proud that we are excellent in mathematics as a nation.

Mathematics is a subject that improves most of the other abilities of your brain such as logical thinking and creative analysis. These abilities will be very helpful to perform well in most of the other subjects comes under Engineering, Science, Accounting, Management, law etc. The effort that any one put to improve their mathematical abilities is very worthwhile to become very sound in educationally. It is hard to complain that any one can't do mathematics.

This is totally depending on their attitude and effort. Every one can learn the subject just by having a positive interest and putting a decent effort. This is applicable for any other subjects as well as for mathematics. If any one complains that mathematics is hard, he or she should first talk to him/herself and check whether a reasonable effort had been put in the past. It is very easy to improve their attitude on the subject.

Student should change that "the attitude of the Poor performance in mathematics is socially acceptable". Sometimes there is a public perception encourage poor performance expectations in mathematics instead of the high expectations that are needed. students shouldn't get caught to this perception.

This series of articles will be targeted the students in following three categories:

I.Juniors (Years 7 & 8)
II.Seniors (Years 9 & 10)
III VCE (Years 11 & 12)

Monthly there will be three sets of questions for the given categories. The suggested answers will be published in the following month with new set of questions. The main concept of this article series is not to teach you chapter by chapter. Issues that have being recognized as confusable (But not as you thought) will be discussed while revising concepts that you learn throughout the year. Further, this will be targeted to:

- improve ability to communicate with mathematics orally and in writing
- improve students' motivation and attitudes towards mathematics
- create a positive atmosphere for learning mathematics
- present mathematics as exciting and interesting
- develop organizational skills and learning how to manage time in mathematical work

Your ideas suggestions and criticisms always welcome to improve this series of articles. Please don't hesitate to contact the author via pasqualathil_g@curl.aunz.net . The author wishes you all the Very Best.




## යමක වග්ග 5



**වෛර නොකිරීම උතුම් ගුණයකි**

නහ වේරේන වේරානි-
සම්මන්තීධ කුදාචනං
අවේරේන ච සම්මන්නි
ඒස ධම්මෝ සනන්තනෝ

මේ ලොව
වෛරයෝ වෛරයෙන්
කිසි කලෙක නොසන්සිදෙත්.
මෛත්‍රියෙන්ම සන්සිඳෙත්
මෙය සදාතනික දහමකි.

Na hi verena verani-
sammanti'dha kudacanam
Avereacha sammanti-
esa dhammo sanantano

**Anger is conquered by love .**

Hatreds never cease through hatred in this world. Through love alone they cease. This is an eternal law.

## නිදානය

**නපුරු පැතීමක් ඉටුවීම**

සැවැත් නුවර එක් තරුණයෙක් පියාගේ වියොවින් පසු තම වතු පිටි දියුණු කර, ධනය රැස්කර ගනිමින්, තම මවද රැක බලා ගෙන වාසය කෙ-ය. හේ ගුණ යහපත් පුතෙකි. කීකරුව ලෙන්ගතුව වැඩෙන පුතු ගැන සිතූ මව ඔහුට විවාහයක් කර දීමට තීරණය කළා ය. පුතුගේ එතරම් කැමැත්තක් නුවුනත් පුතු කැමති කරවා ගත් මව පුතුට ගැලපෙන විවාහයක් කර දුනි. කල් ගත වුවත් දරු පල නොදැරූ හෙයින් ඈ වඳ ස්ත්‍රියක් බව මව දැන ගත්තාය. දරු නැති කුලය හා ධනය නැසෙතැයි සිතූ මව පුතුට තවත් විවාහයක් කර දීමට සිතීය. පෙර බිරිඳ මේ බව දැන තමාට අවනතව සිටීමට අළුත් බිරිඳ කැමති නම් පමණක් අවසරය ලබා දුන්නාය. මව තම පුතුට තව විවාහයක් කර දුනි. බිරින්දෑ වරු දෙදෙනාම හිමිද සමග එකට විසූහ.

පසු කලකදී පළමු බිරිඳගේ සිත නොසන්සුන් විය. ඒ අනික් ස්ත්‍රියට දරුවන් ලැබුණොත් ගේ දොර වතු පිටි මුදල් සියල්ලම අයිතිය හිමි වන්නේ ඇයටය.තමාට විපතක් වෙන්නට හැකි බව සිතීය. කල් ඇතිවම එයට පිළියම් යෙදීමට සිතා අළුත් බිරිඳ සමඟ බොහෝ ලෙන්ගතුව දරුවකු ලැබෙන බව දැන ගත් පසු තමාට දන්වන්නැයි කීය. දෙවන බිරිඳට දරුවකු ලැබුමට ලකුණු පහළ වූ පසු ඒ බව පළමු බිරිඳට දන්වන ලදී. එවිට පළමු බිරිඳ ආහාර සමඟ දරු ගැබ වැටෙන්නට බොහෙත් ආහාර සමඟ කලවම් කරදී දරුපල නැති කළහ. මේ බව තේරුම් ගත් දෙවන බිරිඳ තුන්වන දරු ගැබ හටගත් කළ ඒ බව අර වඳ ස්ත්‍රියට නොදැන්වීය. මුහුකුරා එන දරු ගැබ සහිත උදරය දුටු වඳ ස්ත්‍රියට තරහ සිත ඇති වී පෙර සේ ආහාරයට ගබ්සා බෙහෙත් යොදා දුනි. දරු ගැබ මෝරා තිබූ බැවින් නොවැටී කුස තුල දරු මරණය සිදුවිය. මවද මිය යන මොහොතේ, තී මාගේ දරු දෙදෙනෙක්ම පළමු නැසීය. දැන් මේ කුස බිළිඳා හා මමත් නැසීමට සලැස්වුහ. මිමද මතු යකිනියක්ව ඉපිද තීත් තිගේ දරුවනුත් නසිමියි ශාප කර මරණයට පත්විය.

ඒ පැතුම පරිදි ඔවුන් දෙදෙන බොහෝ නොයෙක් අත් බැව්හිදී ඉපිද දරුවන් සමඟ විනාශයට පත් වුහ. අප බුදුරදුන් කළද යකිනියක්ව ඉපිද ඇගේ දරු දෙදෙනෙකුම නැසුයේය. තෙවන දරු සිගිත්තා බුදුහිමියන් බේරා දී වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව වදාරා ඔවුන් දෙදෙනා සමගියෙහි පිහිටුවා වෙර සංසිඳවූ සේක.